සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

Learning Resource Ce... R De Mazenod College Kandana

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
**Year End Evaluation - 2023 (2024)**

9355

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 03 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40 කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස් වලට අනුකූලව සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

---

- අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

1. පෘථිවියේ ජල ප්‍රමාණය ඝන කිලෝමීටර් මිලියන .............................. ක් පමණ බව ගණනය කර ඇත.
(1836 / 1386 / 1638)

2. ප්‍රාවරණය, පෘථිවිය මතුපිට සිට .............................. ක් පමණ ගැඹුරට විහිදෙන ස්තරයකි.
(2900km / 2250km / 1220km)

3. උන්නතාංශය අඩු විශාල ප්‍රදේශයක පැතිරී ඇති තල්ලබාර් තැන්න .............................. පිහිටා ඇත.
(චීනයේ / රුසියාවේ / ඕස්ට්‍රේලියාවේ)

4. ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීම සඳහා .............................. පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත.
(අගලවත්ත / තලවකැලේ / අඹේවෙල)

5. ඉහළ යකඩ ප්‍රමාණයක් ඇති යපස් පහසුවෙන් ලබාගත හැකි නිසා .............................. කලාපයේ යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානයක් ස්ථානගත වී ඇත.
(කුෂ්නෙට්ස් / යොකොහාමා / පිට්ස්බර්ග්)

- අංක 6 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය නිවැරදි නම් "නි" යන්න වටා ද, වැරදි නම් "වැ" යන්න වටා ද රවුමක් අඳින්න.

06. සැක්‍රමැන්ටෝ නිම්නය ආසියාවෙන් බැහැර වී වගා කරන ප්‍රදේශයකි. නි / වැ

07. ඔක්කම්පිටිය ප්‍රදේශයේ කෙඹලින් පිගන් මැටි නිධියක් පිහිටා ඇත. නි / වැ

08. හග්ගල, යාල හා රිටිගල වන සතුන්ගේ ආරක්ෂාව සඳහා වෙන් වූ අභයභූමි තුනකි. නි / වැ

09. භෞතික ජීවන තත්ත්ව දර්ශකය සංවර්ධනය මැනීමේ නූතන මිනුමකි. නි / වැ

10. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1988 දී දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආණ්ඩු අනු මණ්ඩලය පිහිටුවන ලදී. නි / වැ

- අංක 11 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. පැසිපික් සාගරයේ පිහිටි .............................. ලොව ගැඹුරු ම ආගාධය යි.


12. ශ්‍රී ලංකාවේ සුළු පොල් ත්‍රිකෝණය ලෙස රන්න, .............................., තංගල්ල සම්බන්ධ කෙරෙන ප්‍රදේශයෙන් දක්වේ.

13. ශ්‍රී ලංකාවේ .............................. අංශය මගින් 2012 වර්ෂයේ දී දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ලද දායකත්වය 11.1%ක් වේ.

14. පෘථිවි අභ්‍යන්තරයේ දී මැග්මා සිසිල් වී ඝනීභවනය වීමෙන් .............................. ආග්නේය පාෂාණ නිර්මාණය වේ.

15. ශ්‍රී ලංකාවේ බහුලව ම සිදුවන ස්වභාවික ආපදාව ලෙස .............................. හඳුනා ගත හැකි ය.

- අංක 16 සහ 19 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත දී ඇති ප්‍රස්තාර සටහන උපයෝගී කරගන්න.




16. ශ්‍රී ලංකාවට වැඩි ම සංචාරකයන් ප්‍රමාණයක් .............................. වර්ෂයේ පැමිණ ඇත.
17. වර්ෂ 2013, 2014 වර්ෂවල .............................. වැඩි ම සංචාරකයින් පැමිණි රට වේ.
18. වර්ෂ දෙක ම සලකා බැලීමේ දී .............................. අඩු ම සංචාරකයින් පැමිණි රට වේ.
19. වසර දෙක ම සැලකූ විට ආසන්න වශයෙන් සමාන සංක්‍රමණික සංඛ්‍යාවක් පැමිණි රට කුමක් ද? ..............................

- අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරුවල අනුපිළිවෙළට අනුව "ආ" තීරුවේ ඇති තොරතුරු ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළට දැක්වෙන පිළිතුරට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

20.

| "අ" | "ආ" |
|---|---|
| වායුගෝලීය ස්තරය | විශේෂ ලක්ෂණ |
| 1. පරිවර්තීයගෝලය | A. ඕසෝන් ස්තරය |
| 2. අපරවර්තීගෝලය | B. පරිසර පතනශීඝ්‍රතාව |
| 3. මෙසෝගෝලය | C. උෂ්ණත්වය අධික ම ස්තරය |
| | D. විද්‍යුත් ක්‍රියාවලින් බහුලවීම |

(1) A, B, C (2) B, A, D (3) B, C, D (4) C, B, D (.........)

21.

| "අ" | "ආ" |
|---|---|
| භෞතික ලක්ෂණය | ලෝකයේ හිමි වී ඇති ස්ථානය |
| 1. එවරස්ට් | A. විශාලත ම විල |
| 2. සුපීරියර් | B. දිග ම ගංගාව |
| 3. නයිල් | C. උස ම කඳු මුදුන |
| | D. විශාලම සානුව |

(1) A, C, B (2) B, C, A (3) C, A, B (4) D, B, C (.........)

22.

| "අ" | "ආ" |
|---|---|
| වගාව | සුදුසු පස |
| 1. රබර් | A. ලවන මිශ්‍ර වැලිපස |
| 2. වී | B. ජලය රඳන දියළු පස |
| 3. තිරිඟු | C. චර්නෝසම් පස |
| | D. කබොක් මිශ්‍ර රතු පස |

(1) A, B, C (2) B, C, A (3) C, B, A (4) D, B, C (.........)

23. "අ" "ආ"

ගිනිකඳු | පිහිටි රට
--- | ---
1. විසුවියස් | A. ඉතාලිය
2. ක්‍රැකටෝවා | B. පිලිපීනය
3. පිනාටුබෝ | C. ඉන්දුනීසියාව
 | D. අයිස්ලන්තය

(1) A, C, B (2) B, A, C (3) C, D, B (4) D, C, A (..........)

24. "අ" "ආ"

භෝග වර්ගය | පුහුණු මධ්‍යස්ථානය
--- | ---
1. මාංශ භෝග | A. මාතලේ
2. කෘෂි තාක්ෂණික උද්‍යාන | B. මීවනපලාන
3. සුළු අපනයන භෝග | C. ගන්නෝරුව
 | D. අඟුණකොළපැලැස්ස

(1) A, C, B (2) B, A, C (3) C, B, D (4) D, C, A (..........)

- අංක 25 සිට 37 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු හතර අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියා දක්වන්න.

25. ලෝකයේ ප්‍රධාන කිරිපට්ටි පාලනය කරන රටවල් දෙකක් ඇතුලත් පිළිතුර මින් කුමක් ද?

(1) ඉන්දියාව හා චීනය (2) ඕස්ට්‍රේලියාව හා චිලි
(3) ආජන්ටිනාව හා චීනය (4) නවසීලන්තය හා ජර්මනිය (..........)

26. පරිවහනය සඳහා විල් ජලය භාවිතා කළ හැකිවීම හා විල් අවටින් මූලික අමුද්‍රව්‍ය සපයා ගත හැකිවීම මත කර්මාන්ත ස්ථාන ගත වී ඇති ස්ථානයක් වන්නේ,

(1) කුෂ්නෙට්ස්ක් කලාපයයි. (2) පීට්ස්බර්ග් කලාපයයි.
(3) ලැන්කෂයර් කලාපය (4) යොකොහමා කලාපය (..........)

27. ශ්‍රී ලංකාවේ මිනිරන් කර්මාන්තයේ පවතින ගැටළුවක් නොවෙන්නේ,

(1) පරිසරයට හානි සිදුවීම ය. (2) කැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම ය.
(3) දේශීය කාර්මික අමුද්‍රව්‍යයක් ලෙස භාවිතා කිරීමයි. (4) සේවක සෞඛ්‍ය ගැටළු ඇතිවීම ය. (..........)

28. වර්තමානයේ එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස මෝටර් රථ කර්මාන්තය ව්‍යාප්ත වී ඇති රටවල් කාණ්ඩය වන්නේ,

(1) තායිවානය, දකුණු කොරියාව, සිංගප්පූරුවයි. (2) ජපානය, චීනය, ඉන්දුනීසියාවයි.
(3) දකුණු කොරියාව, සිංගප්පූරුව, ඉන්දියාවයි. (4) බ්‍රිතාන්‍ය, තායිවානය, සිංගප්පූරුවයි. (..........)

29. ශ්‍රී ලංකාවේ භාවිත ජාන තාක්ෂණය හා ක්ලෝනකරණය මගින් වැඩි ඵලදාවක් ලබාදීමට හඳුන්වා දුන් බීජ වර්ග අඩංගු පිළිතුර මින් කුමක් ද?

(1) IR 64, IR 8, Morin 10 (2) BG 407, BG 450, AT 307
(3) BG 407 H, IR 36, TN - I (4) BT ප්‍රභේදය, BARIM 8, Morin 10 (..........)

30. A - ධීවර කර්මාන්තයට ඉතා ප්‍රයෝජනවත් ය.
B - දූපත්, බොංකු, කලපු, තුඩු දක්නට ඇත.
C - එහි මුහුදු සම්පත් සියල්ල රජයට අයත් ය.
D - සංචාරක කර්මාන්තයට ප්‍රයෝජනවත් ය.
ඉහත ලක්ෂණ වලින් සමන්විත සාගර කලාපය වන්නේ,

(1) යාබද කලාපයයි. (2) පරම ආර්ථික කලාපයයි.
(3) රාෂ්ට්‍රීය මුහුදු සීමාවයි. (4) ඉහත සියල්ලම අයත්ය. (..........)

31. • අර්ධ වශයෙන් දිරාපත් ද්‍රව්‍ය අඩංගු මහලකි.
• ඉහළ මහළින් කාන්දු වන ලවණ වර්ග අඩංගුයි.
• මැටි වර්ග තැන්පත් වී ඇත.
• තරමක් ලා වර්ණයෙන් යුතු වේ.
ඉහත ලක්ෂණ වලින් සමන්විත පාංශු මහල වන්නේ,

1. A මහල ය. 2. B මහලය. 3. C මහල ය. 4. R මහල ය. (..........)

32. ජන සංඛ්‍යාව සැළකීමේ දී මිනිසාට උපතින් ම හිමිවන ලක්ෂණ තුනක් ඇත්තේ මින් කුමන පිළිතුරේ ද?

(1) පුමිතිරි බව, සාක්ෂරතාවය, වයස (2) පුමිතිරිබව, මානව වර්ගය, වයස
(3) ජාතිය, ආගම, භාෂාව (4) වයස, පුමිතිරිබව, ජාතිය (..........)

33. ශ්‍රී ලංකාවේ අඩුම ජන සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්ක දෙකක් වන්නේ,

(1) වව්නියාව හා පුත්තලම ය. (2) කිලිනොච්චිය හා අම්පාර ය.
(3) මුලතිව් හා මඩකලපුව ය. (3) මුලතිව් හා මන්නාරම ය. (..........)

34. ලෝකයේ සංවර්ධනය මැනීම සඳහා භාවිතා කරන පැරණි මිනුමක් නොවන්නේ මින් කුමක් ද?

(1) මුර්ත දළ ජාතික නිෂ්පාදිතය. (2) ප්‍රතිශීර්ෂ දළ ජාතික නිෂ්පාදිත ය.
(3) දළ ජාතික නිෂ්පාදිතයෙ වර්ධන වේගය (4) භෞතික ජීවන තත්ත්ව දර්ශක ය. (..........)

35. ප්‍රජාවට බහුලව ම ආපදා සිදුවන අකුණු සැර වර්ගය මින් කුමක් ද?

(1) වලා අකුණු (2) වායු අකුණු (3) පෘථිවි අකුණු (4) විදුලි අකුණු (..........)

36. ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම කෙරෙහි බලනොපාන වායු වර්ග දෙකක් ඇතුලත් වන පිළිතුර තෝරන්න.

(1) නයිට්‍රජන්, ඔක්සිජන් (3) හීලියම්, නයිට්‍රජන්
(2) ඔක්සිජන්, මීතේන් (4) කාබන්ඩයොක්සයිඩ්, ඕසෝන් (..........)

37. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1988 දී දේශගුණ වෙනස්වීම පිළිබඳ වාර්තා කිරීමට පිහිටුවනු ලැබූ සංවිධානය වන්නේ,

(1) ලෝක කාලගුණ විද්‍යා සංගමය (WMO)
(2) එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (UNEP)
(3) ස්වභාවධර්මය සංරක්ෂණ පිළිබඳ ජාත්‍යන්තර සංගමය (IUCN)
(4) දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර් ආණ්ඩු මණ්ඩලය (IPCC) (..........)

• පහත A, B, C හා D මගින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යයනය කොට අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A ළමා ජන සංඛ්‍යාව
ආයු අපේක්ෂාව

B උච්චත්වය
උෂ්ණත්වය

C වනරෝපණය
කාර්මීකරණය

D ගිනිකඳු පිපිරීම
ගෝලීය උණුසුම

38. පළමු වැන්න වැඩිවීම දෙවැන්නේ අඩුවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

39. පළමු වැන්න වැඩිවීම දෙවැන්න වැඩිවීමට හේතුවන මාතෘකා යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D (..........)

40. පළමු වැන්නේ අඩුවීම දෙවැන්නේ ප්‍රතිශතය වැඩිවීමට හේතු වන මාතෘකා යුගලය තෝරන්න.

(1) A (2) B (3) C (4) D (..........)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

9344

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | II |
|---|---|---|---|---|---|

- මෙම ප්‍රශ්න පත්‍රය I සහ II වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- I කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි (අ) (ආ) සහ (ඉ) කොටස් තුනට ම පිළිතුරු සැපයිය යුතුය.
- II කොටසින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

## I කොටස

1. (අ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකාවේ 1 : 50000 හු ලක්ෂණ සිතියම් කොටස අධ්‍යයනය කර, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පිළිතුරු ලිවීම සඳහා ඔබ වෙත සපයා ඇති කඩදාසිය (පිටු අංක 07) යොදා ගන්න.

- අංක (i) සිට (v) දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(i) A චතුරස්‍රය තුළ දක්නට ලැබෙන සංස්කෘතික ලක්ෂණය කුමක් ද?
(අතු ගංගාව / ගංඟාදරය / හේන) (ලකුණු 01)

(ii) B චතුරස්‍රය තුළ දක්නට ලැබෙන ජලවහන රටාව කුමක් ද?
(ජාලාකාර / ශාඛීය / අරීය) (ලකුණු 01)

(iii) C සිට D දක්වා මාර්ගයේ දිග කොපමණ ද?
(9km / 7km / 6km) (ලකුණු 01)

(iv) E චතුරස්‍රය තුළ දක්නට ලැබෙන හු විෂමතා ලක්ෂණය කුමක ද?
(හුදකලාකන්ද / කොත්කන්ද / කඳුවැටිය) (ලකුණු 01)


(v) F අක්ෂරයෙන් දක්වෙන සංස්කෘතික ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(vi) G - H රේඛාවෙන් දක්වා ඇති භෞතික ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(vii) J - K රේඛාවෙන් දක්වෙන හු විෂමතා ලක්ෂණය කුමක් ද? (ලකුණු 01)

(viii) සිතියම් ප්‍රදේශයේ බහුලව ම දක්නට ලැබෙන බෝග වර්ග දෙක කුමක් ද? (ලකුණු 02)

(ix) L - M දක්වා ඇඳ ඇති රේඛාව හා සම්බන්ධ නිවැරදි හරස්කඩ වන්නේ කුමක් ද? (ලකුණු 01)




(ලකුණු 01)

(ආ) (i) ෂැංහයි නගරය (A) (B) (C)
(ii) තස්මේනියාව (L) (N) (M)
(iii) කොංගෝ ගඟ (U) (V) (W)
(iv) කැලිෆෝනියා අර්ධද්වීපය (I) (J) (K)
(v) ඉරාන් සානුව (O) (S) (R)

(ලකුණු 05)

(ඉ) (i) කන්කසන්තුරේ Ⓐ Ⓑ Ⓒ
(ii) ලංකාපටුන Ⓞ Ⓟ Ⓠ
(iii) යාල අභය භූමිය Ⓤ Ⓥ Ⓦ
(iv) බෝගල මිනිරන් පතල Ⓖ Ⓗ Ⓘ
(v) ඩෙල්ෆ් දූපත Ⓓ Ⓔ Ⓕ (ලකුණු 05)

## II - කොටස

2. (i) පෘථිවි කබොලෙහි කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) ප්‍රාවරණයේ ගති ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)
(iii) පෘථිවි කබොලෙහි ප්‍රයෝජන තුනක් ලියා දක්වා ඉන් එකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

3. (i) දකුණු ඇමරිකාවේ ව්‍යාපාරික කිරිපට්ටි පාලනය කෙරෙන රටවල් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)
(ii) ලෝකයේ කිරිපට්ටි පාලනයේ විශේෂ ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) (a) ශ්‍රී ලංකාවේ කිරිපට්ටි පාලනය දියුණු කිරීමෙන් ජනතාවට ලබාගත හැකි ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
(b) ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

4. (i) අමුද්‍රව්‍ය පදනම් කරගෙන යකඩ හා වානේ කර්මාන්තය ස්ථාන ගත වී ඇති රටවල් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 02)
(ii) යකඩ හා වානේ කර්මාන්තයේ නව ප්‍රවනතා තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථිකයට කර්මාන්ත අංශයෙන් ලැබෙන පිටිවහල ක්ෂේත්‍ර තුනක් යටතේ දක්වා ඉන් එක් ක්ෂේත්‍රයකින් ලැබෙන දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 05)


5. (i) මිනිසාට ජලය ලබාගත හැකි ජල මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ජලයේ ගුණාත්මකභාවය අඩුවීම කෙරෙහි බලපාන මිනිස් ක්‍රියාකාරකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) ජල සම්පත සංරක්ෂණය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

6. (i) ලෝකයේ ජනාධික කලාප දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ලෝකයේ ජන සංකේන්ද්‍රණ කලාප ආශ්‍රිතව අධික ජන සංඛ්‍යාවක් ඒකරාශිවීමට බලපා ඇති සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහය ආශ්‍රිතව දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ තුනක් සඳහන් කර ඉන් එක් ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

7. (i) ශ්‍රී ලංකාවේ දැනට භාවිතා වන අධිවේගී මාර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)
(ii) මානුෂ සංවර්ධන දර්ශකය ගණනය කිරීමේදී භාවිතා වන ප්‍රධාන නිර්ණායක තුන ලියා දක්වන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය අරමුණු කරගෙන අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනයට මෑත කාලයේ ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)


8. (i) ලෝකයේ ලැව්ගිනි ආපදාව බහුල ව දැකිය හැකි ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ලැව්ගිනි ආපදාව නිසා පරිසරයට ඇති වන බලපෑම් තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) ශ්‍රී ලංකාවේ ජල ගැලීම් ආපදාව අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ආ)




(i)
(ii)
(iii)
(iv)
(v)

(ඉ)




(i)
(ii)
(iii)
(iv)
(v)